# බහුජාතක බහුසංස්කෘතික කෙප්පය

ලෝකයේ ඉතිහාසයක් ඇති කිසිම රටක් බහුසංස්කෘතික රටක් නො වෙයි. එහෙත් බටහිරයෝ අපේ රටවල් බහුසංස්කෘතික යැයි හඳුන්වති. අපේ රටවල් බහුසංස්කෘතික යැයි කියා තම රටවල් ඒකසංස්කෘතික යැයිකීමට බැරි හෙයින් ඔවුහු ඒ රටවල් ද බහුසංස්කෘතික යැයි කියති. එහෙත් දැන් දැන් ඔවුන්ට තම බහුජාතක (බහුජාතික නොවේ) බහුසංස්කෘතික සංකල්පය දිරවාගැනීමට නොහැකි වී ඇත. අද ඕස්ට්‍රේලියාව, ඇමරිකා එක්සත් ජනපදය, ප්‍රංශය වැනි රටවල ද විශේෂයෙන් ම බ්‍රිතානියේ ද, බටහිරයන්ට, එනම් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සුද්දන්ට බහුසංස්කෘතික සංකල්පය ප්‍රශ්නකිරීමට සිදුවී තිබීම දෛවයේ සරදමකි. පසුගියදා එක්සත් රාජධානියේ, එනම් එංගලන්තයෙහි හා එංගලන්තය විසින් අත්පත්කරගනු ලැබූ පළමු යටත්විජිතවල, මුස්ලිම් කාන්තාවන්ගේ ඇඳුම පිළිබඳ ව ප්‍රශ්නයක් පැනනැගුණි. එංගලන්තය හා ඒ අසල පිහිටි යටත්විජිත හැඳින්වීම සඳහා නිවැරදි වචන එක්සත් රාජධානිය වුව ද, අපි පහසුව සඳහා බ්‍රිතානිය යන වචනය යොදාගනිමු. බ්‍රිතානි පාර්ලිමේන්තුවේ වත්මන් සභානායකවරයා වූ ජැක් ස්ට්‍රෝ මහතා කියා සිටියේ තමා හමුවට එන මුස්ලිම් කාන්තාවන් “වේලය” ඉවත්කර පැමිණිය යුතු බව ය. එනම් මුස්ලිම් කාන්තාවන් සාම්ප්‍රදායික මුස්ලිම් ඇඳුමින් සැරසී නොසිටිය යුතු බව ය.

දැනට මාස හතකට පමණ පෙර එංගලන්තයේ පාසලක මුස්ලිම් ශිෂ්‍යාවකට තම සාම්ප්‍රදායික ඇඳුමින් පැමිණීම තහනම් කෙරිණි. ඒ පිළිබඳ මේ තීරුවෙන් ද කතාබහ කෙරිණි. ශිෂ්‍යාව පාසලට විරුද්ධව අධිකරණයට ගියා ය. අධිකරණයෙහි තීන්දුව වූයේ පාසල ඇගේ අයිතියක් පැහැරගෙන ඇති බව ය. එහෙත් පාසල ඉන්පසු සාමි මණ්ත්‍රණ මණ්ඩලයේ විනිසුරුවන් වෙත අභියාචනයක් ඉදිරිපත් කෙළේ ය. එහි දී තීන්දු කෙරුණේ පාසල මුස්ලිම් විශ්වාසයන්ට ද ගරුකරමින් ඒකාකාර ප්‍රතිපත්තියක් සැලසුම්කර ඇති බව ය. එයින් සාමි මණ්ත්‍රණ මණ්ඩලයේ විනිසුරුවන් කියා සිටියේ ශිෂ්‍යාවන් පාසලට ඒකාකාරීව ගවුමින් සැරසී සිටිය යුතු බව ය. ගවුම නිර්මාණය කෙරුණේ මුස්ලිම් සංස්කෘතියෙහි නො වෙයි. එය ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නිර්මාණයකෙරුණකි. සාමි මණ්ත්‍රණ මණ්ඩලයේ විනිසුරුවෝ ඒ බවක් නොකියා ගවුම සියළු සංස්කෘතීන් මත පැටවූහ. ඒ විනිසුරුවන්ට එරෙහිව ඊනියා ජාත්‍යන්තර අධිකරණයට යැමට හැකි දැයි නො දනිමි. එසේ ගියත් ඊනියා ජාත්‍යන්තර අධිකරණය ද ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නිර්මාණය වී ඇති බැවින් වෙනත් තීන්දුවක් අපේක්ෂාකළ නො හැකි ය. ඊනියා ජාත්‍යන්තරය යනු බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ජාත්‍යන්තරය වෙයි. ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව යන සංකල්පයෙන් හැඳින්වෙන බටහිර ප්‍රධාන රටවල් සිංහල බෞද්ධ නොවන බවට අටුවා ටීකා අනවශ්‍ය වෙයි.

කෙසේ වෙතත් මේ නඩු තීන්දුව සඳහන්කිරීමත් සමග අපට ලංකාවේ වත්මන් බ්‍රිතානි මහාකොමසාරිස්වරයා මෑතක දී කර තිබූ ප්‍රකාශයක් මතක් වෙයි. ඔහු කියා තිබුණේ බ්‍රිතානීන් ලංකාවෙන් ඉවත්ව යන විට සුළු ජාතීන්ගේ අයිතීන් රැකීමට අවශ්‍ය තරම් ආරක්ෂණ විධි විධාන නීති පොතට ඇතුළත්කර නොතිබූ බව ය. ලංකාවේ දේශපාලනඥයන්ගේ නිවට බව හේතුවෙන් මෙරට දේශපාලනයට ඇඟිලි ගසන මේ මහා කොමසාරිස්වරුන්ට හා තානාපතිවරුන්ට මතක්කර දිය යුතු කරුණක් වෙයි. ඒ අන්කිසිවක් නොව සෝල්බරි ව්‍යවස්ථාවෙහි අපකීර්තිමත් 29 වැනි වගන්තිය ය. මේ වගන්තිය බ්‍රිතානීන් විසින් ඇතුලත් කරනුලැබුයේ ඊනියා සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් රැකීමට ය. (සුළු ජාතින් ඇතිකෙරුණේ බ්‍රිතානීන් විසින් බව අමතක නොකළ යුතු ය.) ඒ අනුව මෙරට ශ්‍රේෂ්ඨාධිකරණයෙහි තීන්දුවකට එරෙහිව වුව ද බ්‍රිතානි සාමි මණ්ත්‍රණ මණ්ඩලයේ විනිශ්චයකාර මණ්ඩලයට අභියාචනා කළ හැකි විය. මේ වගන්තියෙන් අපට 1948 දී ලැබුණි යැයි කියන නිදහස කප්පාදු වී තිබුණි. අපේ රටේ ප්‍රශ්න සම්බන්ධයෙන් අවසාන තීන්දුව දීමේ බලය බ්‍රිතානි අධිකරණයට හිමිවිය. අද දෙමළ ජාතිවාදීන් මෙන් ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වෙනුවෙන් පෙනී සිටින කසිකබල් සතිඅන්ත පුවත්පතක් හා වෙනත් එවැනි ආයතන ද 29 වැනි වගන්තියේ වැදගත්කම ගැන කතාකරනු දැකිය හැකි ය. මේ වගන්තිය අපේ සීමිත නිදහස තව තවත් කප්පාදු කළ බව මොවුහු අමතකකරති.

යම්කිසි අයුරකින් ලංකාවේ අදත් ක්‍රියාත්මකවන්නේ සෝල්බරි ව්‍යවස්ථාව නම් හා මුස්ලිම් පාසල් දැරියකට එංගලන්තයේ මෙන් පාසලකට මුස්ලිම් ඇඳුමින් සැරසී පැමිණීම තහනම් කෙරී ප්‍රශ්නය 29 වැනි වගන්තිය යටතේ සාමි මණ්ත්‍රණ සභා විනිසුරුවන් කරා ගියේ නම් ඒ අධිකරණය කිනම් තීන්දුවක් දීමට තිබුණි ද? ලංකාවේ දේශ පාලනයට ඇඟිලිගසන බ්‍රිතානි මහා කොමසාරිස්වරයාගෙන් මේ ප්‍රශ්නය ඇසුවේ නම් බ්‍රිතානීන්ට සුපුරුදු ආකාරයට

© Prof. Nalin De Silva

හා මෙරට ඇතැමුන් ද බ්‍රිතානි අනුකරණයෙන් දැන් පුරුදු වී ඇති ආකාරයට ඔහු බොහෝවිට ඒ සෝපාධික (හයිපොතටිකල් - උපකල්පිත) ප්‍රශ්නයක් යැයි කියනු ඇත. ලංකාවේ එවැනි ප්‍රශ්නයක් සිංහල පාසලක උද්ගත නොවන බැවින් ඒ ප්‍රශ්නය සැබවින් ම සෝපාධික ප්‍රශ්නයක් වෙයි ; ජාතිවාදීන් ආගම්වාදීන් ආදී වශයෙන් හංවඩුගසා ඇති සිංහල බෞද්ධයන් ප්‍රජාතන්ත්‍රවාදය අකුරට ම අනුගමනයකරන්නේ යැයි කියන බ්‍රිතානියේ මෙන් ඒ ඒ ජනවර්ගවල ඇඳුම් පිළිබඳ ව තහංචි පනවා නැති බැවින් ඒ ප්‍රශ්නය සෝපාධික වෙයි. එහෙත් මෙහි දී නොකියාම බැරි කරුණක් වෙයි. බදුල්ලේ දෙමළ පාසලක දෙමළ විදුහල්පතිවරයකු හෝ විදුහල්පතිනියක හෝ වසර දෙකකට පමණ පෙර මුස්ලිම් ශිෂ්‍යාවන් සම්බන්ධයෙන් එවැනි තහංචියක් පැනවූ බව අපට අමතක නො වේ. එහෙත් සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් නැතැයි කියන මේ රටේ ඒ පාසලේ මුස්ලිම් ශිෂ්‍යාවන්ට පසුව තමන්ට රිසි අයුරින් තම සම්ප්‍රදායික ඇඳුමින් සැරසී පැමිණීමේ නිදහස ලැබුණි. කෙසේ හෝ 29 වැනි වගන්තිය ක්‍රියාත්මක කෙරී ඒ ප්‍රශ්නය යම් අයුරකින් සාම් මණ්ත්‍රණ මණ්ඩලය තෙක් ඇදී ගියේ නම් අපට බ්‍රිතානි කුහකකම (බ්‍රිටිෂ් හිපොක්‍රසි) පිළිබඳ තවත් උදාහරණයක් එකතුකරගැනීමට තිබුණි. යම් අයුරකින් සිංහල පාසලක එවැනි ප්‍රශ්නයක් ඇතිවී නම් මහා කොමසාරාස්වරුන් ද, තානාපතිවරුන් ද, රාජ්‍ය නොවන පඬිවරුන් ද, අලෙවි නොවන පුවත්පත්වල කතෘ මාණ්ඩලිකයන් ද ආදී එකී නොකී ඊනියා මානව හිතවාදීන් බහුසංස්කෘතික මාසයක් පවත්වා ජාතිවාදී යැයි කියන සිංහල බෞද්ධයන්ට සුළු ජාතික අයිතිවාසිකම් කියාදීමට තිබුණි. අවශ්‍ය නම් කිහිප දෙනකුට එංගලන්තයට ගොස් සුළු ජාතික අයිතිවාසිකම් රැකෙන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්කිරීමේ වරම ද හිමිවීමට තිබුණි.

ඉහත කී ආකාරයෙන් එංගලන්තයේ මුස්ලිම් ජනයාගේ මානව අයිතිවාසිකම් "රැකීමට" ඉදිරිපත් වී ඇත්තේ දේශපාලනඥයන්, සාම් මණ්තණ මණ්ඩලයේ විනිසුරුවන්, නිලධාරීන් ආදීන් පමණක් නො වෙයි. ඒ සඳහා එංගලන්තයේ ක්‍රිස්තියානි පල්ලිය වූ ඇංග්ලිකන් පල්ලිය ද ඉදිරිපත් වී ඇත. ටෙලිග්‍රාෆ් පුවත්පතට අනුව ආණ්ඩුව මුස්ලිම් ජනයාට වැඩි සැලකිල්ලක් දක්වන්නේ යැයි කියන ලියවිල්ලක් පසුගිය දා බිෂොප්වරුන් අතර සාකච්ඡාවට භාජනය වී ඇත. ඇංග්ලිකන් පල්ලිය ආණ්ඩුවේ ඊනියා බහුආගමික (බහු විශ්වාස - මල්ටි ෆේත්) වැඩ පිළිවෙළට විරුද්ධ වෙයි. ප්‍රශ්න විසඳීමේ දී එක් සුළු ජනවර්ගයක් පමණක් සහභාගිකර නොගෙන බහුතර ජනවර්ගය, එනම් ක්‍රිස්තියානි, සහභාගිකරගැනීමේ වැදගත්කම ගැන ලියවිල්ලෙන් පෙන්වා දී ඇත. පල්ලියට අනුව ප්‍රශ්නය විසඳිය යුත්තේ බහුතරයේ සහභාගීත්වයෙන් හා රටේ හර සංස්කෘතිය (කෝර් කල්චර් - මධ්‍ය සංස්කෘතිය) පදනම් කරගනිමිනි. ඒ සියල්ලෙන් පසු බිෂොප්වරු කියන්නේ රටේ පාදක සංස්කෘතියට විශේෂයෙන් ඇංග්ලිකන් පල්ලියෙන් හා සාධාරණ වශයෙන් ක්‍රිස්තියානියෙන් කෙරී ඇති ප්‍රදානය ඉතා වැදගත් බව ය. යම් අයුරකින් මෙරට මහානායක හිමිපාණන් වහන්සේලා අතින් හෝ යම් නිකායක කාරක සභාවෙන් හෝ අනුරූප ප්‍රකාශයක් කෙරිණි නම් ඒ මුළු මහත් ලෝකයම කලඹන සිද්ධියක් බවට පත්වීමට තිබුණි. බුදු දහම පාවාදීම පිළිබඳ ව, සිංහල බුද්ධාගම බුදුන් වහන්සේගේ බුදු දහමෙන් වෙනස්වීම පිළිබඳ ව, මහාවංසයට හා මහාවිහාරයට විරුද්ධව සම්මණ්ත්‍රණ, වැඩමුළු, උද්ඝෝෂණ පැවැත්වීමට, පොතපත නිකුත්කිරීමට, චිත්‍රපටි හා ටෙලිනාට්‍ය නිෂ්පාදනයකිරීමට, රාජ්‍ය නොවන සංවිධානවලට බත්බැළයන් මිළ දී ගැනීමට තවත් අවස්ථාවක් ලැබීමට තිබුණි. මෙරට තකතීරු මානවහිතවාදීන්ගේ හැකර කටවල් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වෙනුවෙන් තවත් වරක් ඇරෙනු දැකගන්නට තිබුණි. 1972 ව්‍යවස්ථාවෙන් බුද්ධාගම ගැන සඳහන්කර ඇති දේ මේ හැකරයන්ට මොන තරම් හිසරදයක් ද?

මේ තකතීරුවන් තම හැකර කටවලින් කුමක් පිටකළ ද (මොවුන්ගේ කටවල් ඇත්තේ ශරීරයේ කිනම් පැත්තක ද යන්න වෙනම ප්‍රශ්නයකි) බ්‍රිතානියේ අද සිදුවෙමින්  පවතින දැයින් පෙන්නුම්කෙරෙන්නේ එහි නාමික ව පවත්වාගෙන ගිය ව්‍යාජ බහුසංස්කෘතික සංකල්පය පුස්සක්, කෙප්පයක් වී ඇති බව ය. ඒ බහුසංස්කෘතික මනස්ගාතය ක්‍රිස්තියානි නූතනත්වය වෙනුවෙන් බටහිර සමාජවිද්‍යාඥයන් හා දේශපාලනවිද්‍යාඥයන් විසින් නිර්මාණයකෙරුණු බහුජාතක (කිහිප දෙනකුගේ සහභාගීත්වයෙන්) සංකල්පයකි. කිසිම සංකල්පයක්, ප්‍රවාදයක් නිර්මාණයකිරීමට නොහැකි මෙරට උගත්තු මේ කෙප්පය පට්ටාගැසුහ. එහෙත් අපි හර සංස්කෘතියක්, මධ්‍ය සංස්කෘතියක්, පොදු සංස්කෘතියක් ගැන අවුරුදු විස්සකට ආසන්න කාලයක් මුළුල්ලේ කතාකෙළෙමු. අද මෙරට නොව එංගලන්තයේ ඇංග්ලිකන් පල්ලිය අප පසුපස්සේ සංකල්පීය වශයෙන් පැමිණීම පිළිබඳ ව අපි සතුටු වෙමු. එහෙත් මේ බහුබූත, බහුජාතක බහුසංස්කෘතික සංකල්පය බටහිර විකාශය වූ ආකාරය පිළිබඳ අපේ ප්‍රවාදයක්, අපේ විග්‍රහයක්, ඉදිරිපත්කළ යුතුව ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva